# මැතිවරණ කොමිෂන් සභාව

## ඇබෑර්තු - ප්‍රධාන මූල්‍ය නිලධාරී

මැතිවරණ කොමිෂන් සභාවේ 2026.06.15 දින සිට පුරප්පාඩුවීමට නියමිත ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර සඳහා සුදුසු නිලධාරියකු ස්ථාන මාරු කරවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයදුම්කරුවන් :*

- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු විය යුතුය.
- තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් හෙබිවිය යුතුය.
- කිසිදු දේශපාලන පක්ෂයක, අපේක්ෂක ප්‍රවර්ධනයක් හෝ අගතියක් සිදුවන පරිදි දේශපාලන සබඳතා නොපැවැත්විය යුතුය.
- අනුප්‍රාප්තිකයින් රහිතව හෝ අනුප්‍රාප්තිකයකු පසුව ලබාදීමේ පදනම මත නිදහස් කරවා ගැනීමට ආයතන ප්‍රධානීගේ එකඟත්වය තිබිය යුතුය.
- අවම වශයෙන් වසර 4ක කාලයක්වත් මැතිවරණ කොමිෂන් සභාව යටතේ සේවය කිරීමට තරම් වයස් මට්ටමක සිටීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

අයදුම්පත් තම ජීව දත්ත තොරතුරු ද සමග 2026.04.30 දින හෝ ඊට පෙර මැතිවරණ කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර අයදුම්පත එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ **"ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුරු පුරප්පාඩු පිරවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**එච්.එම්.ටී.ඩී.හේරත්,**
ලේකම්,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.